# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,3501 - 2023 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.09.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2380 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2386 |


*සැ. යු.-* (i) සුසරණ ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ඔක්තෝබර් මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


2377 - B 82491 — 5,403 (2023/09)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම - 2023

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙ හි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරුවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවා කොන්දේසි* :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධානවලට ද 'ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්' තනතුරට තෝරාගනු ලබන අපේක්ෂකයෙකු යටත් වන්නේ ය.

2.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව වන 12.18 වගන්තිය ප්‍රකාර ව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති හා/හෝ ඉදිරියේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

03. *වැටුප* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ වැටුප් පරිමාණය SL 1-2016 (මාසික) රු. 47,615/- 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක් වේ. (මෙම තනතුරට හිමි ආරම්භක වැටුප SL 1 - 2016 වැටුප් පරිමාණයේ 12 වන පියවර වේ. ඒ අනුව ආරම්භක වැටුප රු. 62,595 කි.) පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. *සුදුසුකම්* :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම,

සහ

(ආ) 2023.09.22 දිනට වයස අවු. 30ට නොඅඩු සහ අවු. 45ට නොවැඩි වීම,

සහ

(ඇ) අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු වීම හෝ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I වන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම සහ එම තනතුරක ස්ථිර කර තිබීම,

හෝ

(ඈ) අවුරුදු 07කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදී සිටින නීතිඥවරයෙකු වීම.

*සටහන* :-

i. යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නීතීඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නෛතික තත්වයෙන් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් සේවය කරන ලද කාල පරිච්ඡේදයක් ක්‍රියාකාරී ව වෘත්තියෙ හි යෙදී සිටි කාල පරිච්ඡේදයක් වශයෙන් සලකනු ලැබේ.

ii. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිරත නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

iii. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 13.5 අනුව ''**සතුටුදායක සේවා කාලය**'' යනු උපලේඛනගත රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු/ඇය විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දාවූ කාලසීමාවක් වන්නේ ය.

(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඊ) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*සැ. යු.*- සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2023 සැප්තැම්බර් මස 22 වැනි දින** හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. මූලික සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව තනතුර සඳහා සුදුස්සෙකු තෝරාගනු ලැබේ.

07. තනතුර සඳහා බඳවා ගනු ලැබුයේ ඉහත 05(ඇ) යටතේ වූ සුදුසුකම් සපුරන ලද නිලධරයෙකු නම්, මෙම තනතුරට පත්වීමේ දින සිට වසර එකක වැඩ බැලීමේ සේවා කාලයකට යටත් වන්නේය. තනතුර සඳහා බඳවාගනු ලැබුයේ ඉහත (05) (ඈ) යටතේ වූ සුදුසුකම් මත නම්, එසේ තනතුරට පත් වූ නිලධරයකු පත්වීමේ දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

08. තමා වෙත පිරිනමන ලද තනතුරෙ හි රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හෝ පත් කරන ලද තනතුරෙ හි රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවකුගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

09. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදු කළ බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) අයදුම්පත්‍ර ගාස්තුව රු. 500 කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වෙල්ල විදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 297100199025039 ට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්කරුගේ නම ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග ලියාපදිංචි තැපැල් මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ භාරදීමෙන් අයදුම්පත ලබාගත හැකිය. මුදල් ගෙවීම සඳහා අදළ ලදුපත සම්පූර්ණ කිරීමේ දී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, **2023.10.20 දින** හෝ ඊට පෙර ලැබෙන පිණිස 'ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12, යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

11.(අ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චය-කාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥ-වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඇ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම් පත්‍රයක නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිඳු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

12. මෙහි ඉහත 01 සිට 11 දක්වා ඡේද/වගන්තීන්වල විධිවිධාන සලසා නොමැති කරුණක් වෙතොත් ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත් ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරනු ඇත.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

09-415

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2023 ඔක්තෝබර් මස 23 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 ජූලි මස 04 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | රුවන්වැල්ල | කරවනැල්ල මූලික රෝහල් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

09-308

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2023 ඔක්තෝබර් මස 23** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | මීගමුව | මීගමුව නගරය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |
| ගම්පහ | මීගමුව | මීගමුව නගරය (රෝහලෙන් පිට) කොට්ඨාසයේ උප්පැන්න හා මරණ අතිරේක රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

09-307

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.***- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 ඔක්තෝබර් මස 23** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 අගෝස්තු මස 31 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | උඩුබද්දාව | කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

09-305

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

**අම්පාර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම 1'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 ඔක්තෝබර් මස 23** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 අගෝස්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | අඩ්ඩාලච්චේනය | අඩ්ඩාලච්චේනය 03 කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| අම්පාර | කාර්තිව් | නින්දවූර් පත්තු (මාලිගාකාඩු) කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

09-306

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (ඛණ්ඩ 2)
I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023

2023.06.02 දිනැති අංක 2,335 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ 06-71/1 නිවේදනයේ 10 (02) වන කරුණු පහත පරිදි සංශෝධනය කරමි.

කාර්යාල පරිපාලනයට අදාළවන ගැටළුවකට ගතයුතු ක්‍රියාමාර්ග විභාගවන පරිදි සැකසුනු බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතුවේ.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2023 අගෝස්තු මස 25 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
''ඉසුරුපාය''
බත්තරමුල්ල.

09-316/1

---

සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (ඛණ්ඩ 2)
II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023

2023.06.02 දිනැති අංක 2,335 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ 06-71/2 නිවේදනයේ 10 (01) වන කරුණු පහත පරිදි සංශෝධනය කරමි.

ආයතන සංග්‍රහයේ I හා II කාණ්ඩවල අඩංගු විධිවිධාන පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. ආයතන සංග්‍රහයේ I වැනි කණ්ඩයේ I, II, IV, VII, VIII, XII පිළිබඳ සාමාන්‍ය අවබෝධය හා ආයතන සංග්‍රහයේ II වැනි ඛණ්ඩයේ පරිච්ඡේද XL, VII පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2023 අගෝස්තු මස 25 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
''ඉසුරුපාය''
බත්තරමුල්ල.

09-316/2

---

**ක්‍රීඩා, යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අංශය**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2024/2025**

ක්‍රීඩා, යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතුය.) අතර සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඃ

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුලු ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් සම්මාන 03 ක් සහිත ව සමත් විය යුතුය.

තවද ඔහු හෝ ඇය,

*(අ)* පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසලක යටත් පිරිසෙයින් මාස 06 ක පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

*හෝ*

*(ආ)* ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

*හෝ*

*(ඇ)* පාසල් ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම.

*හෝ*

*(ඈ)* කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරගයකට සහභාගී වී තිබීම

*හෝ*

*(ඉ)* ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම, එසේ නැතහොත් ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයක දී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතුය.

2. අයදුම්පත් එවීමේ ක්‍රමය ඃ-

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8" x 13 ½" ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර **2023.10.31** වැනි දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත ආකෘතිය ප්‍රකාර ව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ ''2024/2025 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව'' සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

2.3 රජයේ සේවය, පළාත් රාජ්‍ය සේවය, සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. තෝරා ගැනීම ඃ

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත්‍ර අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. පාඨමාලාව පිළිබඳ විස්තර ඃ

4.1 විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05 කින් සමන්විත වේ. ඃ

(අ) **පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත**
ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්ෂණයකින් සමන්විත වේ.

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රයෝගික දැනුම

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථාවෝචිත පරිදි තෝරාගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය.

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව **මාස 12 කි.**

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් රු. 60,000.00 ක මුදලක් පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලා ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතු අතර පාඨමාලා සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්ෂකයන් පමණි. එමෙන් ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ''ලේකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, යටිතල පහසුකම්

සංවර්ධන අංශය'' යනුවෙන් සටහන් කළ යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ''ක්‍රීඩා ඩිප්ලෝමා'' සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. අනෙකුත් කොන්දේසි :-

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 එසෙකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

5.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළයුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.4 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2023 සැප්තැම්බර් මස 11 වැනි දින,
අංක 100/7 නිදහස් මාවත,
කොළඹ 07.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2024/2025*

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය**

පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්

01. i. සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනෙවිය.

ii. මුලකුරු සමග නම :————.

iii. සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි භාෂාවෙන් - කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

iv. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. ලිපිනය i. පෞද්ගලික :————.

ii. රාජකාරී :————.

03. දුරකථන අංකය (පෞද්ගලික) :————. දුරකථන අංකය (රාජකාරී) :————.

i. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

ii. 2023.10.31 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? නැතිද? යනවග :————.

පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :————.

05. i. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

ii. විවාහක/අවිවාහක බව :——————.

06. ඔබ රැකියාවක් කරයි ද?/නොකරයි ද? යන වග

i. තනතුර :——————.
ii. සේවා කාලය :——————.
iii. සේවා ස්ථානය :——————.

07. i. අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ෑ

වර්ෂය | | | | |    විභාග අංකය :——————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ෑ

වර්ෂය | | | | |    විභාග අංකය :——————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

iii. වෙනත් අධ්‍යාපන සුදුසුකම් (උසස් විභාග/උපාධි)

වර්ෂය | | | | |    විභාග අංකය :——————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න. සියලුම සහතිකපත් වල ඡායා පිටපත් අමුණා එවන්න.)

1. ජාතික මහා ක්‍රීඩා උළෙලේ දක්ෂතා දිස්ත්‍රික්/පළාත්/ජාතික ෑ
..............................................................................................................................
..............................................................................................................................

2. ජාතික සංගම් මගින් පවත්වනු ලබන ජාතික තරගවල දක්ෂතා ඃ
......................................................................................................................................................
......................................................................................................................................................

3. ජාත්‍යන්තර තරග සඳහා සහභාගීත්වය ඃ
......................................................................................................................................................
......................................................................................................................................................

09. i. *ගැසට්* නිවේදනය 1.1 ඡේදයේ දක්වා ඇති කුමන ඡේදය යටතේ ඉල්ලුම් කරන්නේ ද යන්න දක්වන්න.

| අ | ආ | ඇ | ඈ | ඉ |
|---|---|---|---|---|
| | | | | |

ii. ඉහත දක්වා ඇති එම ඡේදයේ විස්තර වී ඇති පරිදි ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර ඃ

......................................................................................................................................................
......................................................................................................................................................

10. වෙනත් කරුණු ඃ
......................................................................................................................................................
......................................................................................................................................................

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත් රු. 60,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද ?
යන වග ඃ ......................................................................................................................................
......................................................................................................................................................
මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සෙකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

රජයේ, පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

මෙම ................................ සේවය කරන .............. වන .............................................. මහතා/ මහත්මිය/මෙනෙවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :————.

නම :————.
තනතුර :————.

09-332

අධ්‍යාපන අමාත්‍යාංශය

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

*පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2024 ජනවාරි කණ්ඩායම*

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙ හි (IETI) පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා තරුණ තරුණියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. *පවත්වනු ලබන පාඨමාලා* :

| | *පාඨමාලා විස්තර* | *පාඨමාලා ගාස්තුව රු.* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* |
|---|---|---|---|---|
| **01, 02, 03, 04, 05, වෘත්තීන් සඳහා අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 6 ක් සමත් වී තිබීම හෝ අ. පො. ස. (උ. පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 2න් එක් විෂයයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ. පො. ස. (සා. පෙළ) සිංහල භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 ක් සමත් වී තිබීම.** | | | | |
| 01. | ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) - Electronics Craftsman **(Special)** (Basic Work Shop practice, Domestic Electrical Installation, Analog & Digital Electronic, Thyristor Power Control, Electrical Machines, Motor Drives, Pneumatic Control System, PLC & Micro Controller Based Control Systems (PIC & ARDUINO) & Project Works | 150,000 | 4 මට්ටම | අවු. 03 |
| 02. | විදුලි කාර්මික ශිල්පී (විශේෂ) - Electrician **(Special)** මූලික වැඩහල් පුහුණුව, ගෘහස්ථ හා කර්මාන්තශාලා විදුලි පරිපථ, විදුලි මිනුම් උපකරණ, ගෘහස්ථ/ කර්මාන්තශාලා ආරක්ෂක හා සන්නිවේදන පද්ධති වායු පාලන තාක්ෂණය, PLC තාක්ෂණය, ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස්, ඔටෝමේෂන් පද්ධති | 150,000 | 4 මට්ටම | අවු. 03 |
| 03. | ඉදිකිරීම් සුපරීක්ෂක - **Construction Supervisor** (Construction Management, Basic Workshop Practice, Basics in Construction Technology, Basics in Engineering and Architectural Drawings and Auto Cad, Construction Materials, Surveying and Levelling, water supply, Drainage and Sewerage Systems, Road Construction and Quantity Surveying and Cost Estimates) සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දූවැන්ත සමාගම් සමග වැඩබිම් පුහුණුව | 100,000 | 4 මට්ටම | අවු. 01 1/2 |
| 04. | ප්‍රමාණ සමීක්ෂණ සහකාර - **Quantity Surveying Assistant),** (Preparation of BOQ for small and medium construction, Pricing of BOQ, Prepare Bidding Document) | 50,000 | 4 මට්ටම | අවු. 01 |
| 05. | සැළසුම් ශිල්පී - **Draughtsperson** (Building Construction, Building Services, Mathematics, Geometrical and Mechanical Drawings, Surveying and Levelling, Auto CAD, Electrical and Plumbing Drawings, Drawing Office activities, Building Services Drawings) | 80,000 | 4 මට්ටම | අවු. 01 1/2 |

| | පාඨමාලා විස්තර | පාඨමාලා ගාස්තුව රු. | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය |
|---|---|---|---|---|
| **06, 07, වෘත්තීන් සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත්වීම.** | | | | |
| 06. | ශීතකරණ හා වායු සමන යාන්ත්‍රික ශිල්පි - **Refrigeration & Air Conditioning Mechanic**<br>මූලික වැඩහල් පුහුණුව, සියලුම වර්ගයේ ශීතකරණ, ගෘහස්ථ හා කර්මාන්ත ශාලා වායු සමීකරණ පද්ධති | 100,000 | 4 මට්ටම | අවු. 02 |
| 07. | යන්ත්‍ර ශිල්පි (විශේෂ) - **Machinist (Special)**<br>Lathe, Milling, Grinding Machine Operation, Pneumatic and Hydraulic systems, Heat Treatment, CNC Programming, CNC Machining, EDM Process, Wire Cutting Process, LASER Cutting, Solid works , Auto Cad | 150,000 | 4 මට්ටම | අවු. 03 |
| **08, 09 වෘත්තීන් සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.** | | | | |
| 08. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පි - **Information & Communication Technology Technician**<br>(Maintain files & folders, Ms Word, Ms Excel , Ms Power point, Maintain Database ( Ms Access) , Internet & E- mail, Install & Configure operating system, Installation & troubleshooting of Network, Graphic for Web, Design static web pages, Develop Basic Software Solution) | 40,000 | 4 මට්ටම | අවු. 01 |
| 09. | පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පි - **Computer Graphic Designer**<br>(Adobe Photoshop, Adobe Illustrator, Adobe InDesign, Coral Draw, Printing & Scanning Method) | 40,000 | 4 මට්ටම | අවු. 01 |
| 10, 11, 12, 13, 14 වෘත්තීන් සඳහා අවම වශයෙන් අ .පො. ස. (සා. පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම. | | | | |
| 10. | පෑස්සුම් ශිල්පි (විශේෂ) - Welder (Special )<br>(MMA/ GAS/TIG/MIG/ MAG/FCAW /PLASMA/SPOT/STUD Welding ශිල්පීය ක්‍රම, Destructive & Non Destructive Testing Methods, Plate & Pipe weld) | 150,000 | 4 මට්ටම | අවු. 03 |
| 11. | පොත් බඳින්නා - Book Binder<br>මුද්‍රණ කර්මාන්තය හඳුන්වාදීම, පොත් බැඳීම සහ අවසන් කිරීම, පොත් බැඳීමේ අවසාන කිරීමේ කොටස් හැඩගැස්වීම, මුද්‍රණයට සූදානම් වීම/ හිස් කඩදාසි සුරක්ෂිත කිරීම, Finishing කොළ සූදානම් කිරීම, එකතු කරගත් කොටස් සුරක්ෂිත කිරීම, පොත් කවරය සූදානම් කිරීම, Finishing කිරීම, Spring back පොත් බැඳීම, Rebinding කිරීම | 15,000 | 4 මට්ටම | අවු. 01 1/2 |
| 12. | දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - Carpenter (Furniture)<br>අත් ආවුද භාවිතය සහ මූලික දව මූට්ටු වැද්දීම හා නවීන යන්ත්‍ර ආරක්ෂිතව පරිහරණය කොට දව සහ සංයුක්ත දව මඟින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, අත් ආවුද සහ යන්ත්‍ර තල මුවහත් තැබීම හා නඩත්තුව, නවීන ආවුද හා උපකරණ භාවිතයෙන් ගෘහ භාණ්ඩ නිමහම් කිරීම (පොලිෂ් කිරීම), දව තාක්ෂණය පිළිබඳ න්‍යායික දැනුම, කාර්මික ඇඳීම හා කාර්මික ගණිතය භාවිතයෙන් ඇස්තමේන්තුව පිළියෙළ කිරීම | 20,000 | 4 මට්ටම | අවු. 02 |
| 13. | ඇලුමිනියම් පිරිසැකසුම්කරු - Aluminium Fabricator<br>ඇලුමිනියම් ජනෙල් සහ දොරවල් සෑදීම, බෙදුම්කඩ (Partitions) කඩසාප්පු දොර සහ බිම්කඩ වෙන් කිරීම, ඉනිමං ඉදිකිරීම්, Glass & Tempered Glass සවිකිරීම, ප්‍රදර්ශන කබඩ් සෑදීම, නාන කාමර වෙන් කිරීම (Shower cubicles) ඇතුලත දොර ඉදිකිරීම් සහ සවිකිරීම (Roller doors) ඇලුමිනියම් සිවිලිම ඉදිකිරීම සහ සවිකිරීම, වෙනත් ඇලුමිනියම් උපාංග සවිකිරීම) | 20,000 | 4 මට්ටම | අවු. 01 |

| | පාඨමාලා විස්තර | පාඨමාලා ගාස්තුව රු. | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය |
|---|---|---|---|---|
| 14. වෘත්තීය සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබීම. | | | | |
| 14. | **ජලනල කාර්මික ශිල්පී** - Plumber<br>දැනට කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතා වන PVC, CPVC,GI, PB, PPR හා HDPE නල වර්ග But fusion, Heat fusion, හා Electro fusion වැනි අති නවීන තාක්ෂණික ක්‍රමෝපාය භාවිතා කරමින් සම්බන්ධ කිරීම, නවීන සනීපාරක්ෂක උපාංග ස්ථාපනය, ජල පොම්ප ස්ථාපනය, උණුසුම් ජලනල පද්ධති ස්ථාපනය සහ සැලසුම් නිර්මාණය හඳුනා ගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම | 60,000 | 4 මට්ටම | අවු. 02 |

- පාඨමාලා ගාස්තු වාරික වශයෙන් ගෙවීම් කළ හැක.
- කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය මගින් පිරිනැමෙන පූර්ණ කාලීන පාඨමාලා සහතිකය සහ ඊට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිරිනැමෙන ජාතික වෘත්තීය සුදුසුකම් (**NVQ**) සහතිකය ද හිමිවේ.

02. *වයස* : **2023.10.27** වැනි දිනට වයස අවුරුදු 16 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුය.

03. *පුහුණුව පිළිබඳ විස්තර* :

3.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළ දී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේ දී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් බහුලව ඇත. සියලුම පාඨමාලාවන් සඳහා ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දෙනු ලැබේ.

04. *තෝරා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

05. *ප්‍රතිලාභ* :

5.1 දුර අනුව නේවාසිකාගාර පහසුකම් (පිරිමි ළමුන්ට පමණයි)
5.2 පුස්තකාල පහසුකම්
5.3 සහන මිලට ආහාරපාන

06. *අයදුම්පත් එවිය යුතු ආකාරය* :

6.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරගත් හෝ www. naita. gov. lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සමඟ **2023.10.27** දිනට පෙර **අධ්‍යක්ෂ/ විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ **"ආධුනිකයින් බඳවා ගැනීම 2024 ජනවාරි"** යන්න සඳහන් කළයුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමඟ එවිය යුතුය.

6.2 මහජන බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 313100153656984 ට බැර කරන ලෙස සඳහන් කරමින් ඕනෑම බැංකු ශාඛාවකට රු. 1000 ක් ගෙවා ලබාගත් ලදුපත (තැන්පත්කරුගේ නම සහ හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය) අයදුම්පතට ඇමිණිය යුතු අතර, එහි ඡායා පිටපතක් ඔබ සතුව තිබිය යුතු වේ. එසේ අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.3 එක් අයදුම්කරුවෙකු තම අධ්‍යාපන සුදුසුකම් අනුව කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතු ය.

6.4 තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. රුවික අමරසේකර,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ආදර්ශ අයදුම් පත්‍රය (11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ)

*ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය*

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

*ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2024 ජනවාරි*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :......................................................................................මයා/මිය/ මෙනෙවිය

02. මුලකුරු සමග නම :........................................................................................

03. ලිපිනය :........................................................................................

04. පදිංචිය (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .................................................
(ii) දිස්ත්‍රික්කය : .................................................

05. දුරකථන අංකය : නිවස : ...................................... ජංගම : ................................ Whatsapp.අංකය :-.........
විද්‍යුත් තැපැල (ඊ-මේල්) :-...............................................

06. උපන් දිනය :.............................................

07. ජාතික හැඳුනුම්පත් අංකය :.............................................

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම X ලකුණින් සලකුණු කරන්න)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ. පො. ස. (උ. පෙළ) | | අ. පො. ස. (සා. පෙළ) | | 8 ශ්‍රේණිය | |

අ .පො .ස .(සා. පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො.ස . (උ. පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.-

| | |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

.....................................,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

09-321

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

(නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන , පර්යේෂණ හා නව නිපැයුම් අංශය)

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) ඛණ්ඩ - 03 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (සීමිත) බඳවා ගැනීම - 2023**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා, පහත ක්ෂේත්‍රයන් හි නියමිත සුදුසුකම් සපුරා ඇති කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL 3-2016) ට අයත් තනතුරුවල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *ක්ෂේත්‍රය* |
|---|
| ලෝහ වැඩ ශිල්පය |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය |
| විදුලි ශිල්පය |
| ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය |
| ඇළුමිනියම් පිළිසකරකරණය |

01. බඳවා ගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන් , පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. අංක 06හි සඳහන් විෂය

නිර්දේශය යටතේ අයදුම් කරන ක්ෂේත්‍රයට අදාළ දැනුම මැන බලන ප්‍රශ්න පත්‍රයකට හා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය මැන බලන ප්‍රශ්න පත්‍රයකට සියළු අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. අංක 07හි සඳහන් ලකුණු දීමේ පටිපාටියට අනුකූල ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වේ.

02. අවශ්‍ය සුදුසුකම්

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-

තනතුරෙ හි කාර්යභාරයට අදාළ ව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) 5 වන මට්ටමේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම,

හෝ

තනතුරෙ හි කාර්යභාරයට අදාළ ව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) 4 වන මට්ටමට ඇතුළත් වන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතික ලබාතිබීම සහ වෘත්තීය සුදුසුකම ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05)කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම,

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලී වැඩ ශිල්පය හෝ ලෝහ වැඩ ශිල්පය හෝ මෝටර් යාන්ත්‍රික ශිල්පය හෝ විදුලි ශිල්පය හෝ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය පිළිබඳව අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් හෝ ඇළුමිනියම් පිළිසකරකරණය පිළිබඳ එක් වසරක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

I. **සේවා පළපුරුද්ද :**
අයදුම්පත් කැඳවන දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL 3-2016)ට අයත් තනතුරක ස්ථිර පත්වීමක් ලැබ යටත් පිරිසෙයින් අවුරුදු 7ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

II. **කායික සුදුසුකම් :**
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. **වෙනත් :**
අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කොට තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

I. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද , ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. පත්වීම අවුරුදු එකක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ය. ශිල්ප ප්‍රදර්ශක III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව දැනට දරන තනතුරට අදාළ ප්‍රවීණතාවය ලබා තිබුණ ද මෙම තනතුරට අදාළ අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද , රජයේ මුදල් රෙගුලාසිවලට ද , දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. වයස් සීමාව

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාවක් නැත.

05. වැටුප් පරිමාණය

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MT1-2016 වැටුප් බණ්ඩය යටතේ මෙම තනතුරට රු. 29,840-10 x 300-11 x 350-10 x 560-10 x 660-රු.48,890/-ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

06. **ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ අංකය | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | කාලීන, සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර්ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40% |
| 2 | ලෝහ වැඩ ශිල්පය | ඉංජිනේරු විද්‍යාව, සන්නිවේදන හැකියාව , කාර්මික ඇඳීම, වැද්දුම් යාන්ත්‍රණ ශිල්පය (න්‍යායික), වාත්තු වැඩ. | පැය 02 | 100 | 40% |
| 3 | මෝටර් යාන්ත්‍රික ශිල්පය | ඉංජිනේරු ඇඳීම හා නිර්මාණය, නිෂ්පාදන තාක්ෂණය, යාන්ත්‍රික නඩත්තුව හා බලශක්ති කළමනාකරණය, ස්වයංචල තාක්ෂණය, පෙට්‍රල් /ඩීසල් එන්ජින්, මෝටර් රථ විදුලි කාර්මික | පැය 02 | 100 | 40% |
| 4 | විදුලි ශිල්පය | විදුලි යන්ත්‍ර, බල විද්‍යුතය හා ස්වයංචල පාලන පද්ධති, ක්ෂුද්‍ර සැකසුම් පාදක පද්ධති, ව්‍යවහාරික විදුලි මිණුම්, විදුලි රැහැන් ඇදීම. | පැය 02 | 100 | 40% |
| 5 | ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කිරීම , ඉදිකිරීම් බිම් මැනීම , ජලය පිරිපහදුව හා කසල ජලය බැහැර ලීම,ව්‍යුහ න්‍යාය හා සැලසුම් , ප්‍රමාණ සමීක්ෂණය, | පැය 02 | 100 | 40% |
| 6 | ඇළුමිනියම් පිළිසකරකරණය | ඇළුමිනියම් පිළිසකරකරණය පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික, කාර්මික චිත්‍ර, වෘත්තීය පිළිබඳ ගණිතමය හැකියාව, සෞඛ්‍ය හා ආරක්ෂාව, සන්නිවේදන හැකියාව | පැය 02 | 100 | 40% |

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍රයන්

| ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| 3. අතිරේක පළපුරුද්ද | 30 |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 |
| 5. පරිගණක හැකියාව | 10 |
| 6. සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතාව | 05 |
| එකතුව | 100 |

08. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

09. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :

I. මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපස ම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවටද , අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවටද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කර ගත් අයදුම්පත් තම අත්අකුරින් ම නිසි ලෙස සම්පූර්ණ කොට ''අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව , තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ- 10'' යන ලිපිනයට **2023.10.23** වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා අයදුම්පත්‍රය (සීමිත)'' යන්න පැහැදිලි ව ලියා තිබිය යුතුය.

II. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

III. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

IV. විභාග ගාස්තුව රු.1,000/-ක් වන අතර එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-100-139026228 දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ හා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

V. තම අයදුම්පත් තමන් සේවය කරන ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

VI. දෙපාර්තමේන්තුවේ කිසිවකුගේ නමට අයදුම්පත් නොඑවිය යුතු අතර එසේ එවන හෝ අතින් ගෙනැවිත් භාරදෙන හෝ අයදුම්පත් කිසිවක් භාරගනු නොලැබේ. යම් අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කරන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් ලද බවද දන්වා එවනු නොලැබේ.

10. **විභාග පටිපාටිය :**

I. විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක /අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු /අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළයුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

II. මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක / අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

III. තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහිමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා,
(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත්කළ ජාතික හැඳුනුම්පත, හෝ
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගැනේ.

IV. විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

V. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියළුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාග යට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VI. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ.

VII. මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම.**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

13. මෙම නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557,
ඕල්කොට් මාවත,
කොළඹ- 10

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ)බණ්ඩ - 03
සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (සීමිත) බඳවා ගැනීම 2023
සඳහා වන අයදුම්පත්‍රය

| | |
|---|---|
| අයදුම් කරන ක්ෂේත්‍රය | |
| අයදුම් කරන මාධ්‍යය | |

1. අයදුම්කරුගේ නම ඃ

I. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ-
.....................................................................................................................
.....................................................................................................................

II. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

..........................................................................................................................

..........................................................................................................................

III. සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) :-

..........................................................................................................................

..........................................................................................................................

2. දැනට දරන තනතුර :————.

I. එම තනතුරට පත්වූ දිනය අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

II. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට එම තනතුරෙ හි සේවා කාලය
අවුරුදු :————. මාස :————. දින :————.

3. ලිපිනය හා දුරකථන අංක :

I. කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.

II. පෞද්ගලික ලිපිනය :————.
දුරකථන අංකය :————.
ජංගම දුරකථන අංකය :————.
(ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතුය.)

4. උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

6. ජාතික හැඳුනුම්පත් අංකය :————.

7. ස්ත්‍රී / පුරුෂ භාවය :————.

8. විවාහක /අවිවාහක /වැන්දඹු ද යන වග :————.

9. අධ්‍යාපන සුදුසුකම් :-

අ.පො.ස.(සා.පෙ.) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(උ.පෙ.) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

10. වෘත්තීය සුදුසුකම් :-

| විභාගය/ ඩිප්ලෝමාව | වර්ෂය | පෙනී සිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

11. පළපුරුද්ද පිළිබඳ විස්තරය :-

| සේවය කළ ආයතනය | තනතුර | සේවය කළ කාලය | රාජ්‍ය අංශය/අර්ධ රාජ්‍ය අංශය/පෞද්ගලික අංශය යන වග |
|---|---|---|---|
| | | | |

12. පරිගණක හැකියාව පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාවයන් :
ඩිප්ලෝමාව :————————————.
සහතික පත්‍ර පාඨමාලාව :————————————.

13. ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති ප්‍රවීණතාවය :
ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව :————————————.
ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව :————————————.

14. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :——————————.

මුදල් ගෙවූ දිනය :——————————.

| කුවිතාන්සිය නොගැලවෙන සේ අමුණා එවිය යුතුය. |
|---|

මෙම අයදුම්පතෙ හි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත්වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහකිරීමටත් යටත්වන බවත් මම දනිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ........................................තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ /ප්‍රධාන කාර්යාලයේ සේවය කරන .......................................................................................මයා/ මිය / මෙනවිය දැනට ................................................................. .................. තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ /ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායකවන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් ඔහු /ඇය මා ඉදිරිපිට දී අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :————.
(නිල මුද්‍රාව)

————,
අධ්‍යක්ෂ/විදුහල්පති/අංශ ප්‍රධානියාගේ
අත්සන

09-350/1

---

**අධ්‍යාපන අමාත්‍යංශය**

(නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය)
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) බණ්ඩ - 03 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම - 2023

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා, පහත ක්ෂේත්‍රයන් හි නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *ක්ෂේත්‍රය* |
|---|
| ලෝහ වැඩ ශිල්පය |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය |
| විදුලි ශිල්පය |
| ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය |
| ඇළුමිනියම් පිළිසකරකරණය |

01. **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන් , පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. අංක 06 හි සඳහන් විෂය නිර්දේශය යටතේ අයදුම් කරන ක්ෂේත්‍රයට අදාළ දැනුම මැන බලන ප්‍රශ්න පත්‍රයකට හා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය මැන බලන ප්‍රශ්න පත්‍රයකට සියලු අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. අංක 07 හි සඳහන් ලකුණුදීමේ පටිපාටියට අනුකූල ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වේ.

02. **අවශ්‍ය සුදුසුකම් :**

*අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-*

තනතුරෙ හි කාර්යභාරයට අදාළ ව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) 5 වන මට්ටමේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබාතිබීම,

හෝ

තනතුරෙ හි කාර්යභාරයට අදාළ ව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 4 වන මට්ටමට ඇතුළත් වන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ වෘත්තීය සුදුසුකම ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05)කට නොඅඩු පළපුරුද්දක් ලබාතිබීම,

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලී වැඩ ශිල්පය හෝ ලෝහ වැඩ ශිල්පය හෝ මෝටර් යාන්ත්‍රික ශිල්පය හෝ විදුලි ශිල්පය හෝ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය පිළිබඳව අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් හෝ ඇළුමිනියම් පිළිසකරකරණය පිළිබඳ එක් වසරක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබාතිබීම.

I. පළපුරුද්ද :
රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 01කට නොඅඩු කාලයක් සේවයේ යෙදී පළපුරුද්දක් ලබාතිබීම.

II. කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. වෙනත් :

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කොට තිබිය යුතුය.

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද , ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. ශිල්ප ප්‍රදර්ශක III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්ව වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද , රජයේ මුදල් රෙගුලාසිවලටද , දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. වයස් සීමාව :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර , අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MT1-2016 වැටුප් බණ්ඩය යටතේ මෙම තනතුරට රු. 29,840-10 x 300-11 x 350-10 x 560-10 x 660-රු. 48,890/-ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

06. *ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | කාලීන, සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර්ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40% |
| 2 | ලෝහ වැඩ ශිල්පය | ඉංජිනේරු විද්‍යාව, සන්නිවේදන හැකියාව , කාර්මික ඇඳීම, වැද්දුම් යාන්ත්‍රණ ශිල්පය (න්‍යායික), වාත්තු වැඩ. | පැය 02 | 100 | 40% |
| 3 | මෝටර් යාන්ත්‍රික ශිල්පය | ඉංජිනේරු ඇඳීම හා නිර්මාණය, නිෂ්පාදන තාක්ෂණය, යාන්ත්‍රික නඩත්තුව හා බලශක්ති කළමනාකරණය, ස්වයංචල තාක්ෂණය, පෙට්‍රල් /ඩීසල් එන්ජින්, මෝටර් රථ විදුලි කාර්මික | පැය 02 | 100 | 40% |
| 4 | විදුලි ශිල්පය | විදුලි යන්ත්‍ර, බල විද්‍යුතය හා ස්වයංචල පාලන පද්ධති, ක්ෂුද්‍ර සැකසුම් පාදක පද්ධති, ව්‍යවහාරික විදුලි මිණුම්, විදුලි රැහැන් ඇදීම. | පැය 02 | 100 | 40% |
| 5 | ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කිරීම , ඉදිකිරීම් බිම් මැනීම, ජලය පිරිපහදුව හා කසල ජලය බැහැර ලීම,ව්‍යුහ න්‍යාය හා සැලසුම්, ප්‍රමාණ සමීක්ෂණය, | පැය 02 | 100 | 40% |
| 6 | ඇළුමිනියම් පිළිසකරකරණය | ඇළුමිනියම් පිළිසකරකරණය පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික, කාර්මික චිත්‍ර, වෘත්තිය පිළිබඳ ගණිතමය හැකියාව, සෞඛ්‍ය හා ආරක්ෂාව, සන්නිවේදන හැකියාව | පැය 02 | 100 | 40% |

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍රයන් :*

| *ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| 3. අතිරේක පළපුරුද්ද | 30 |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 |
| 5. පරිගණක හැකියාව | 10 |
| 6. සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතාව | 05 |
| **එකතුව** | 100 |

08. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :**

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

09. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :*

I. මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපස ම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද , අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවට ද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කර ගත් අයදුම්පත් තම අත්අකුරින් ම නිසි ලෙස සම්පූර්ණ කොට "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව , තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ- 10" යන ලිපිනයට **2023.10.23 දිනට** පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා අයදුම්පත්‍රය (විවෘත)" යන්න පැහැදිලි ව ලියා තිබිය යුතුය.

II. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූළ නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

III. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

IV. විභාග ගාස්තුව රු.1,000/-ක් වන අතර එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-100-139026228 දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ හා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

V. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු /සාමදාන විනිශ්චයකාරවරයෙකු /දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.41,580/- ක මාසික ඒකාබද්ධ වැටුප් තලයක් (රා.ප.ච.03/2016 I උපලේඛනය අනුව) ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය .

VI. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

VII. දෙපාර්තමේන්තුවේ කිසිවෙකුගේ නමට අයදුම්පත් නොඑවිය යුතු අතර එසේ එවන හෝ අතින් ගෙනැවිත් භාරදෙන හෝ අයදුම්පත් භාරගනු නොලැබේ. යම් අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ වන පැමිණිලි සලකා බලනු නොලබන අතර අයදුම්පත් ලද බව ද දන්වා එවනු නොලැබේ.

10. විභාග පටිපාටිය ෘ

I. විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක /අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු /අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළයුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

II. මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක / අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

III. තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා,
(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත්කළ ජාතික හැඳුනුම්පත, හෝ
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගැනේ.

IV. විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

V. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාග යට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VI. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ.

VII. මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම.**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

13. මෙම නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්,එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557,
ඕල්කොට් මාවත,
කොළඹ- 10

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ)ඛණ්ඩ - 03
සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම 2023
සඳහා වන අයදුම්පත්‍රය

| | |
|---|---|
| අයදුම් කරන ක්ෂේත්‍රය | |
| අයදුම් කරන මාධ්‍යය | |

1. අයදුම්කරුගේ නම ඃ

I. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ-
..............................................................................................................................
..............................................................................................................................

II. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ-
..............................................................................................................................
..............................................................................................................................

III. සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) ඃ-
..............................................................................................................................
..............................................................................................................................

2. ලිපිනය හා දුරකථන අංක ඃ

I. කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.

II. පෞද්ගලික ලිපිනය :————.
දුරකථන අංකය :————.
ජංගම දුරකථන අංකය :————.
(ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතුය.)

3. උපන් දිනය ඃ

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ
අවුරුදු :————. මාස :————. දින :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————.

6. ස්ත්‍රී / පුරුෂ භාවය :————.

7. විවාහක /අවිවාහක /වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :-

**අ.පො.ස.(සා.පෙ.) විභාගය :**

වර්ෂය :—————. විභාග අංකය :—————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

**අ.පො.ස.(උ.පෙ.) විභාගය :**

වර්ෂය :—————. විභාග අංකය :—————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

9. **වෘත්තීය සුදුසුකම් :-**

| සහතිකපත්‍ර/ ඩිප්ලෝමාව උපාධි හෝ වෙනත් සුදුසුකම් | වර්ෂය | පෙනී සිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/විශ්වවිද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තරය :-

| සේවය කළ ආයතනය | තනතුර | සේවය කළ කාලය | රාජ්‍ය අංශය/අර්ධ රාජ්‍ය අංශය/පෞද්ගලික අංශය යන වග |
|---|---|---|---|
| | | | |

11. පරිගණක හැකියාව පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාවයන් :
ඩිප්ලෝමාව :————————.
සහතික පත්‍ර පාඨමාලාව :————————.

12. ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති ප්‍රවීණතාවය :
ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව :————————.
ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව :————————.

13. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් ඉවත් කර තිබේද ? :————.

14. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද ? :————.

15. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————.

මුදල් ගෙවූ දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙන සේ අමුණා එවිය යුතුය

මෙම අයදුම්පතෙ හි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත්වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත්වන බවත් මම දනිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................................... මයා/ මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු /ඇය .................................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :————.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි)

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ................................................................. මයා/ මිය / මෙනවිය දැනට ........................................................................ තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ /ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු /ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

දිනය :————.
(නිල මුද්‍රාව)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

09-350/2

## මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2023

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ග ගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2023.10.16** වැනි දින වේ.

**සටහන** 1. මාර්ගගතව අයදුම්පත් භාර ගැනීම **2023.09.22 වැනි දින පෙ.ව. 9.00ට ආරම්භ වන අතර 2023.10.16 වැනි දින මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වේ.** අයදුම්පත් භාර ගැනීම අවසන් දින සිට දින තුනක් (3) ගතවන තෙක් දෝෂ සහිත අයදුම්පත් සංශෝධනය කිරීමට අයදුම්කරුවන්ට පහසුකම් සලසා ඇත. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2023 දෙසැම්බර් මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේ දී පුවත්පත් මඟින් දැනුම් දෙනු ඇත. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **යෝග්‍යතාව :**

I. සෑම අයදුම්කරුවකුම ඔහු / ඇය :-

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු බවත්,
(ආ) විශිෂ්ට චරිතයකින් යුතු අයෙකු බවත්,
(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2002.10.16 දින හෝ ඊට පෙර හා 1988.10.16 හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

***සටහන 2*** : යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

II. *ශාරීරික යෝග්‍යතාව* :- පිරිමි අයදුම්කරුවකුගේ උස අඩි 5 අඟල් 5 ට අඩු නොවිය යුතු අතර, පපුව (ප්‍රසාරණය කළ විට) අඟල් 33 ට නොඅඩු විය යුතුය.
අයදුම්කාරියන්ගේ උස අඩි 5 අඟල් 3ට නොඅඩු විය යුතුය.

III. *අධ්‍යාපන සුදුසුකම්* :-සෑම අයදුම්කරුවකුටම/අයදුම්කාරියකට ම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයක් විසින් පිරිනමනු ලබන වසර තුනකට (03) නොඅඩු අධ්‍යයන කාල සීමාවක් සහිත උපාධියක් ;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාග යේදී විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමර්ථයක් ලබා තිබීම. (වෛකල්පික සාමර්ථ්‍යය අදාළ නොවේ.) ;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාග යේ දී විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථයක් ලබා තිබීම.

සටහන 3 : උපාධියකට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයෙකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුවද පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වූ අයෙකුට ඔහු/ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබා ගත් නිල ලිපියක් ඉදිරිපත් කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකිය.

03. සේවා කොන්දේසි :

(I) *වැටුප* - මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත දැක්වේ.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි අනුව වැටුප් ක්‍රමය - MN - 5 දරන වැටුප් කාණ්ඩයේ, රු. 34,605 - 660 x 10 - 755 x 11 - 930 x 15 = රු. 63,460 වේ.

(II) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්විය යුතුය.

(III) තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ව පත් කරනු ලැබේ.

(IV) පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(V) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදී ම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන් ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතුය.

(VI) මෙම *ගැසට් පත්‍රයේ* 1 වැනි කොටස (IIඅ) වැනි ඡෙදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය* : බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (01) | අභියෝගතාව (පැය 01 යි) | ලකුණු 100 යි |
| (02) | ඉංග්‍රීසි භාෂාව (පැය 1 ½ යි ) | ලකුණු 100 යි |
| (03) | නිර්මාණාත්මක හා විශ්ලේෂණාත්මක සන්නිවේදන කුසලතා (පැය 03 යි) | ලකුණු 100 යි |
| | **එකතුව** | ලකුණු 300යි |

*අභියෝගතාව ප්‍රශ්න පත්‍රය* : මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය* : අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

*නිර්මාණාත්මක හා විශ්ලේෂණාත්මක සන්නිවේදන කුසලතා* : දෙන ලද මාතෘකාවන්, තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන් තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන් ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සන්දේශයන් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේ ම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

*සටහන 4* : මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම නිවේදනයේ 02(III) අනුව සුදුසුකම් ලබන විභාග යට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(I) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(II) විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතුය.

(III) *ඇගයීමේ ක්‍රමය* : විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් වූ අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් විභාග අංක පිළිවෙළට/ අකාරාදී පිළිවෙළට සකස් කළ ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. එම ලේඛනයේ සඳහන් අයදුම්කරුවන්/අයදුම්කාරියන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, එහිදී ක්‍රීඩා කුසලතා සඳහා පහත සඳහන් පරිදි ලකුණු 05ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහිදී අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ. සුදුසුකම් පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරුවල සත්‍යතාව වැනි කරුණු මෙහි දී පරීක්ෂා කරනු ලැබේ.

*යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙළ* :-

ජාතික මට්ටමේ කේවල ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානය සඳහා ලකුණු 05යි. දෙවන ස්ථානයට ලකුණු 03යි, තුන්වන ස්ථානයට ලකුණු 02 බැගින් ලබා දෙනු ලැබේ.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර මට්ටමේ කේවල ක්‍රීඩා තරග ප්‍රථම, දෙවන හා තුන්වන ස්ථාන සඳහා ලකුණු 05 බැගින් ලබා දෙනු ලැබේ.

ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවල දී පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයකු හට ලකුණු 03 යි, දෙවන ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයකු හට ලකුණු 02 යි, තුන්වන ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයකු හට ලකුණු 01 බැගින් ලබා දෙනු ලැබේ.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග ප්‍රථම, දෙවන හා තුන්වන ස්ථාන ලබා ගත් කණ්ඩායමක සාමාජිකයකු සඳහා ලකුණු 05 බැගින් ලබා දෙනු ලැබේ.

මෙම තරග සඳහා 17න් පහළ වයස් කාණ්ඩයෙන් පහළ ක්‍රීඩා ඉසව් සලකා බලනු නොලැබේ.

මෙම ක්‍රීඩා තරග සඳහා ලබා දෙන ලකුණු එක් උපරිම සුදුසුකමක් සඳහා පමණක් සීමා කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන් කටයුතු කරන ජාතික බලධාරියාගෙන් සහතික කරවා ගැනීමෙන් අනතුරුව ඉදිරිපත් කළ යුතු වේ.

05. **තෝරා ගැනීමේ පදනම** - ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අදාළ බඳවා ගැනීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත් ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, බඳවා ගැනීමට අනුමත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10% කට නොවැඩි ප්‍රමාණයක් කාන්තා නිලධාරිනියන් සඳහා වෙන් කෙරේ.

05.(I) **ප්‍රතිඵල නිකුත් කිරීම** - ලිඛිත පරීක්ෂණයෙන් සමත් ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ සම්මුඛ පරීක්ෂණ ලකුණු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පසු එම ලකුණු හා ලිඛිත විභාගයේ මුළු ලකුණු එකතු කිරීමෙන් අවසාන ප්‍රමුඛතා ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සකස් කර රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. ප්‍රමුඛතා ලේඛනය ඉදිරිපත් කිරීමත් සමග රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබාගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

***සටහන 5*** : රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරී ස්වභාවය අනුව නිලධාරිනියන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන් හී සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකුම/ අයදුම්කාරියකම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. ***ඉල්ලුම් කිරීමේ පිළිවෙළ*** :

(I) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු/අයදුම්කාරිය විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරග න්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල වල දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන්/අයදුම්කාරියන් ආයතන ප්‍රධානියාගේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව මෙම විභාගය සඳහා අයදුම් කළ යුතු අතර ලිඛිත විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අවස්ථාවේ දී ඔහු/ඇය දැනට දරන සේවයෙන්/තනතුරෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(II) විභාග ගාස්තුව රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකුවක ණය කාඩ් පතක් මගින් (Any bank credit card)
ii. මාර්ගගත ගෙවීම් පහසුකම් සක්‍රිය කර ඇති හර කාඩ්පතක් මගින් (Debit card with online payment facility)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online banking method" Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Slip Payment Bank of Ceylon)

***සටහන 6*** : ඉහත ක්‍රමය මගින් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියෙ හි විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(III) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රමය මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදු වන ප්‍රමාද දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

08. (I) ***විභාග ප්‍රවේශ පත්‍ර*** - ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු

තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචි කරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි වන පරිදි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළග තබාගත් අයදුම්පතේ පිටපතක් හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් ළග තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(II) *විභාගයට ඇතුළත් කර ගැනීම* - විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියකම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාග යට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින පළමු දිනයේ ම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.එසේ නොකරන අයදුම්කරුවෙකුට/අයදුම්කාරියකට විභාග යට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටස (II අ) ඡේදයෙහි විභාග අයදුම්කරුවන්/අයදුම්කාරියන් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අයදුම්කරුවන්/අයදුම්කාරියන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

(III) විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන 7* :- විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරුවකු/ අයදුම්කාරියක් විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. අනන්‍යතාවඃ විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්/අයදුම්කාරියන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. **සුදුසුකම් පිළිබඳ ලියවිලි :**

(I) නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙ හි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(II) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතුය.

(III) සම්මුඛ පරීක්ෂණයේ දී පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සටහන 8** :එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ රජයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින් ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තකු යන මොවුන්ගෙන් කවරකුගෙන් වුව ද ලබා ගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය. (රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.).

(ආ) අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙ හි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

*සටහන 9* :

I. පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උද්ධෘත භාර ගනු නොලැබේ.

II. උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙ හි දැක්වෙන නම/නම් හා අයදුම්කරු/අයදුම්කාරිය සාමාන්‍යයෙන් භාවිත කරන එසේ ම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් අතර වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි

පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

III. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචිවීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි).

IV. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරී ලියවිල්ලක් එනම්, අයදුම්කරු/ අයදුම්කාරිය උපාධි විභාගය සමත් බවට විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද නිල ලියවිල්ලක් හා විභාග දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ්‍යයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය.

V. ජාතික මට්ටමේ හා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක්වූ කුසලතා සම්බන්ධ ලේඛන.

VI. ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අයදුම්කරුවකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* - මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකුට/ අයදුම්කාරියකට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරුවකු/අයදුම්කාරියක විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙකදී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40, කෙළින් වීදිය,
කොළඹ 11.

09-446

---

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2023

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ග ගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023.10.16 දින වේ.

***සටහන*** 01.-මාර්ගගතව අයදුම්පත් භාර ගැනීම 2023.09.22 වැනි දින පෙ.ව. 9.00ට ආරම්භ වන අතර 2023.10.16 වැනි දින මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වේ. අයදුම්පත් භාර ගැනීම අවසන් දින සිට දින තුනක් (3) ගතවන තෙක් දෝෂ සහිත අයදුම්පත් සංශෝධනය කිරීමට අයදුම්කරුවන්ට පහසුකම් සලසා ඇත. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2023 දෙසැම්බර් මාසයේදී දිවයින පුරා පිහිටි පහත දැක්වෙන ප්‍රධාන නගරවලදී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය ඉදිරි කාලයේ දී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

**විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක**

| *පළාත* | *නගරය* | *නගර අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරුමැද | අනුරාධපුරය | 20 |
| | පොළොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොනරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් අයදුම්කරුගේ දෙවන තේරීම අනුව සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත එම අයදුම්කරුවන්/ අයදුම්කාරියන් යොමු කරනු ලැබේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත. විභාගය ඉල්ලුම් කරනු ලබන නගර අයදුම්කරුවන්ගේ අවශ්‍යතාවට පසුව වෙනස් කරනු නොලැබේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව :*

I. සෑම අයදුම්කරුවකුම ඔහු/ඇය .—

(*අ*) ශ්‍රී ලංකා පුරවැසියකු බවත්,

(*ආ*) විශිෂ්ට චරිතයකින් යුතු අයකු බවත්,

(*ඇ*) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 24ට නොවැඩි බවත්, පිළිගතහැකි සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2005.10.16 දින හෝ ඊට පෙර හා 1999.10.16 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

***සටහන 02***— යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

II. *ශාරීරික යෝග්‍යතාව.*— පිරිමි අයදුම්කරුවකුගේ උස අඩි 5 අඟල් 5 ට අඩු නොවිය යුතු අතර, පපුව (ප්‍රසාරණය කළ විට) අඟල් 33 ට නොඅඩු විය යුතුය.

ගැහැණු අයදුම්කාරියන්ගේ උස අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුය.

III. *අධ්‍යාපන සුදුසුකම්.*—සෑම අයදුම්කරුවකුටම/ අයදුම්කාරියකටම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ප්‍රධාන විෂයයන් තුනකින් එකවර සමත්වීම;

*සහ*

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් වශයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව සම්මාන සාමර්ථ්‍යයන් පහක් ද ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත් විය යුතුය.

03. *සේවා කොන්දේසි* :

(I) මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 3/2016 හි අනුව වැටුප් ක්‍රමය - RS - 1 දරන වැටුප් බාණ්ඩයේ, රු. 29,540 - 300 x 7 - 370 x 27 - රු.41,630 වේ.

(II) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

(III) තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(IV) පත්වීම් ලබන්නන් විසින් තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(V) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදී ම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතුය.

(VI) මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. ***විභාග පරිපාටිය***.-බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ. :-

| | |
|---|---|
| (01) අභියෝග්‍යතාව (පැය 01 යි) | ලකුණු 100 යි |
| (02) ගණිතය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (03) ඉංග්‍රීසි භාෂාව (පැය 01 1/2 යි) | ලකුණු 100 යි |
| එකතුව | ලකුණු 300 යි |

*අභියෝග්‍යතාව ප්‍රශ්න පත්‍රය* .-මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*ගණිතය ප්‍රශ්න පත්‍රය*.- අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ ගණිත හැකියාව මැනීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය*.- අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ, ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

***සටහන 03***.-මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02 (III) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම (එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අයදුම්කරුවන් / අයදුම්කාරියන් පෙනී සිටිය යුතුය. කෙසේ වුවද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිට සමත් වූ අයදුම්කරුවකුට / අයදුම්කාරියකට නැතහොත් දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලද අයදුම්කරුවකුට / අයදුම්කාරියකට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයීමට හැකිවේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(I) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(II) විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(III) *ඇගයීමේ ක්‍රමය* : විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබා ගතයුතු අවම ලකුණු ප්‍රමාණය 60%කි. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් වූ අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් විභාග අංක පිළිවෙළට / අකාරාදී පිළිවෙළට සකස් කළ ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. එම ලේඛනයෙහි සඳහන් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලබන අතර ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10ක් ලබා දෙනු ලැබේ. බඳවාගැනීම් සිදුකරනු ලබන අවස්ථාවේ දී විභාගයේදී ලබාගත් ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු පමණක් සැලකිල්ලට ගනු ලබන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ක්‍රීඩා කුසලතා සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ඇත.

05. *තෝරා ගැනීමේ පදනම*.- ලිඛිත විභාගයෙන් සමත් වූ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අදාළ බඳවාගැනීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10%කට නොවැඩි ප්‍රමාණයක් අයදුම්කාරියන් සඳහා වෙන් කෙරේ.

(I) *ප්‍රතිඵල නිකුත් කිරීම*.- ලිඛිත පරීක්ෂණයෙන් සමත් ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පසු එම ලකුණු හා ලිඛිත විභාගයේ මුළු ලකුණු එකතු කිරීමෙන් අවසාන ප්‍රමුඛතා ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සකස් කර රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. ප්‍රමුඛතා ලේඛනය ඉදිරිපත් කිරීමත් සමඟ රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයට ලබාගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට

ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

*සටහන* **04.-** රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරී ස්වභාවය අනුව කාන්තා නිලධාරිනියන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හී සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියක්ම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(I) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල* :

I. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු/අයදුම්කාරිය විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිතා කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන්/අයදුම්කාරියන් ආයතන ප්‍රධානියාගේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව මෙම විභාගය සඳහා අයදුම් කළ යුතු අතර ලිඛිත විභාගයෙන් සමත්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අවස්ථාවේදී ඔහු / ඇය දැනට දරන සේවයෙන් / තනතුරෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

II. විභාග ගාස්තුව රු.600 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකුවක ණය කාඩ් පතක් මගින් (Any bank Credit card)
ii. මාර්ගගත ගෙවීම් පහසුකම් සක්‍රීය කර ඇති හර කාඩ්පතක් මගින් (Debit card with online payment facility)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online banking Method" Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Slip Payment bank of Ceylon)

*සටහන 05* :
ඉහත ක්‍රමය මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

III. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රමය මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන ප්‍රමාද දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. ඉහත ක්‍රමය මගින් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

IV. විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම සිදු කරනු නොලැබේ.

V. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රජයේ සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රජයේ සංස්ථාවක සේවයේ නියුතු අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු / විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

*සටහන 06 :*
ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

08. *විභාග ප්‍රවේශ පත්‍ර :*

*ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ලැබුණු දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය.

(I) කොළඹින් බැහැර අයදුම්කරුවකු/ අයදුම්කාරියක නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. එහි දී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

*සටහන 07 :*
විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරුවකු/ අයදුම්කාරියක විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. අනන්‍යතාව : විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ/ අයදුම්කාරියකගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේම තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි :*

(I) නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(II) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතුය.

(III) සම්මුඛ පරීක්ෂණයේ දී පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්

**සටහන 08 :** එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ රජයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තකු යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබාගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(*ආ*) අයදුම්කරුගේ / අයදුම්කාරියගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

සටහන 09 :

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උද්ධෘත භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අයදුම්කරු/ අයදුම්කාරිය සාමාන්‍යයෙන් භාවිත කරන එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේනම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමිවූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි)

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරී ලියවිලි,

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවල දී දැක්වූ කුසලතා සම්බන්ධ ලේඛන

(vi) අයදුම්පත ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අයදුම්කරුවකු/අයදුම්කාරියක වෙතොත් ඔහු/ඇය මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* - මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරුවකු/ අයදුම්කාරියක විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත් හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

09-449

# ජනමාධ්‍ය අමාත්‍යාංශය

## රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

## ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2023 වර්ෂය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

### පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ පාඨමාලාව
### NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

---

### මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

### පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 23,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 36,000

---

### පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

---

### වෙබ් අඩවි නිර්මාණය - Web Designing

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

---

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**
**පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 36,000
NVQ පාඨමාලාව : රු. 65,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 30,000

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 30,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.21,000

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 27,000

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවකි.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 31,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනයවන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 61,000

**වෙබ් අඩවි නිර්මාණය - Certificate Course in Web Design**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ නවීන තාක්‍ෂණයට අනුකූලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව නවකයන්ට ද මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන සියලු දෙනාටම ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 21,000

**ඩිජිටල් පෙර මුද්‍රණය - Certificate Course in Digital Pre Press**

මෙම පාඨමාලාව තුළින් පෙර මුද්‍රණ තාක්‍ෂණයට අදාළ මෘදුකාංග සහ අනෙකුත් මුද්‍රණ තාක්‍ෂණයට අදාළ ඩිජිටල් ක්‍රියාවලියන් පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : වසර 01යි මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**පිරිවැය හා ඇස්තමේන්තුකරණය - Certificate Course in Costing & Estimating**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයේ පිරිවැයකරණය සමග ඇස්තමේන්තුකරණය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබාදේ. මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද එම ක්ෂේත්‍රයට ඇතුළත්වන නවකයන්ට ද ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01 යි මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**දුරකතන : 011 2686162, 011 2679791, 071 9716655, 077 7706995**
**ෆැක්ස් : 011 2686162**
**ඊ-මේල් : sliopdir@sltnet.lk**
**වෙබ් අඩවිය : www.sliop.edu.lk**

**ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.**
**දුරකතන අංක : 066 2222172, 071 0554298.**

09-000

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.